# Living the LOTUS
Buddhism in Everyday Life

10
2015

VOL. 121


FOUNDER'S ESSAY

## නොකඩවා කිරීමේ ආනිශංස

යමක් 'හොදයි' යැයි සැලකූ විට, එම දවසේ සිට ඒ අනුව කටයුතු කිරීම අපේ ශෛලියයි. එලෙස කටයුතු කිරීම ඇරඹූවිට නොකඩවා දිගටම කරමි. 'ආ..... ඇත්තනේ, ඒ අනුව කටයුතු කලොත් හොදයි' ලෙස අපි හැමෝම එක හා සමානව කල්පනා කරනවා. නමුදු ඒ අනුව ප්‍රයෝගිකව කටයුතු කිරීමට පෙලඹෙන අය හා එසේ නොවන අය සිටියි. එලෙසම ප්‍රයෝගිකව කටයුතු කිරීමට පටන් ගත්තද, දිගටම කරන අය හා දවස් 10 කින් පමණ නතර කරන අයද සිටියි. ඒ ආකාරයේ තිබෙන්නවු පොඩි වෙනසකින් මනුෂ්‍යයින්ගේ සිතිවිලි වල වෙනස්කම් ඇතිවේ.

'අන්‍යයන්ගේ සතුට ප්‍රාර්ථනා කල විට අපේ සතුට ඉබේම ඇතිවේ' ලෙස ඇසෙන විට 'ඇත්ත තමයි' ලෙස සැවොම ඔළුව වනයි. එබැවින් එක් දෙයක් හෝ ප්‍රායෝගිකව දිගටම කිරීමට හැකිවෙනවා නම් මනුෂ්‍යයින්ට අනිවාර්යයෙන්ම සතුටෙන් ජීවත් විය හැකිය. නමුදු 'තමන් ගැන ටිකක්වත් සිතුවේ නැතිනම් පාඩුවක් වේ' ලෙස හැගීම ඇතිවී එම සතුට නැති කර ගනියි.

එබැවින් මුලින්ම 'කුමන ආකාරයේ දෙයක් සිදුවුවත්, ධර්මය විශ්වස කර කටයුතු කරමු' ලෙසින් ස්ථිර අධිටන ඇතිකර ගතයුතුය. එලෙසම තනිවූ විට හෝ අධෛර්යයට පත් වූ විට තමන්ව ධෛර්මත් කරන ධර්ම මිත්‍රයින් ඇතිකර ගත යුතුය. එවිට කොපමණ දුෂ්කරතා දෙයක් වුවද සැහැල්ලු දෙයක් බවට පත් වේ.

නිර්මාතෘ සංකල්පනා 8 පි. 116-117


Living the Lotus
Vol. 121 (October 2015)



【ප්‍රකාශනය】 රිෂ්ෂෝ කෝසෙයි කායි,
අන්තර්ජාතික මුලස්ථානය
5F ෆුමොන් ශාලාව
2-6-1 වදෑ, සුගිනමි කු, ටෝකියෝ, 166-8537
Tel: +81-3-5341-1124
Fax: +81-3-5341-1224
E-mail: living.the.lotus.rk-international
@kosei-kai.or.jp



**Senior Editor:** Shoko Mizutani
**Copy Editor:** P.A.D. Somapala, G.N. Ruklanthi
**Editor:** Etsuko Nakamura
Editorial Staff of RK International


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. එහි සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය මුලික කරගෙන කටයුතු කරනු ලැබේ. පවුල තුලත් ,කාර්යාලයේදීත්, සමාජයේ-දීත් බුදු දහම ජිවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.
වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් අප සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus Buddhism in Everyday Life（සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.）යන තේමාව තුල, එදිනෙද ජිවිතයට සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘද්ධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

# ශ්‍රද්ධාවේ හදවත

නිචිකෝ නිවානෝ
රිෂ්ෂෝ කෝසෙයි සංවිධාන ප්‍රධානී තුමා

## නියම මනුෂ්‍යයකු ලෙස ජීවත්වීම

අපි, සිතන ආකාරයට යම් දේවල් සිදු නොවන විට, කලකිරීමටත් පසුතැවීමටත් පත් වි දුකට පත් වේ. උදහරණයක් ලෙස අඹු සැමියන් අතර, නැන්දම්මා ලේලි අතර ප්‍රශ්නය වුවද අන් අය තමන්ට අවශ්‍ය අයුරින් කටයුතු කලයුතු ලෙස සිතුවත්, ඒ අයුරින් සිදු නොවන තත්වය තුල ප්‍රශ්න හට ගන්නවා නොවේද? එනම් තමාට ප්‍රශ්න හෝ දුක ඇතිවීමට හේතුව නම් තමා මය.

එසේ වුවද, අත්මාර්ථකාමි චින්තනයෙන් පුද්ගලයව හෝ එම තත්වය වෙනස් කිරීමට උත්සහ නොකර තම සිතුවිලි වෙනස් කර ගැනීමෙන්, පරිසරය හෝ තත්වය එසේම තිබුණත් තිබු ප්‍රශ්නය ආශ්චර්යයක් සේ නැතිවී සතුට ළඟා වන්නේය. ප්‍රශ්න නොමැති ජීවි කොට්ඨාශයන් වන සතුන් හා ශාඛ, මෙන්ම අහසේත් පොලොවේත් අප කොටස්කරුවන්වේ. නමුදු මනුෂ්‍යයිනට ආවේනික වු අන්‍යයන්ව නුරුස්සන, අන්‍යයන් ගැන නොසිතන ගතිය නැතිකර ගත් විට අප තුල පවතින ද්වේශ සහගත සිතුවිලි වලින් බැහැරව දුකින් තොර ජිවිතයක් ගත කිරීමට හැකි වේ.

මේ ආකාරයට සැනසුම් සිතින් නියම මනුෂ්‍යයකු ලෙස ජීවිතය ගත කල යුතු වන්නේ කෙසේද? යන්න ආගම ධර්මය විසින් අපට කියාදේ. ඒ අනුව මෛත්‍රියෙන් කරුණාවෙන් හෙබි ප්‍රායෝගික දිවි පෙවතකට හුරුවී කටයුතු කිරීම ශ්‍රද්ධාවයි. නමුදු අප එය නිවැරදිව තේරුම් නොගන්නා අවස්ථා බහුල වේ.

එක් දිනක් පුද්ගලයෙකු විසින් 'ආගම ධර්මය හා ශ්‍රද්ධාව විශ්වාස නොකරන කෙනෙකුට ධර්මයේ වැදගත්කම පැහැදිලි කර දෙන්නේ කෙසේද?' යැයි විමසීය.



විශේෂ වෙහෙසක් දරා ධර්මය අවබෝධ කර දෙනවාට වඩා , සාමාන්‍ය අයුරින්ම ඒ පුද්ගලයා සමග කටයුතු කිරීමයි වඩා හොද.' ලෙස මම පිලිතුරු දුනි. එනම් ශ්‍රද්ධාව යනු බුද්ධ මාර්ගයේ නියමාකාර ලෙස ගමන් කර මෛත්‍රිය හා කරුණාවන්ත හදවතක් ඇති කර ගැනීමයි. අවවාදන් වුවද බලාපොරොත්තු වෙන කෙනෙකුට සිත සැනසීමට පත් වන අයුරින් අවවාද දිය යුතුය. ප්‍රශ්න වලින් පීඩාවට පත්ව සහනයක් බලාපොරොත්තු වන අය වෙනුවෙන් හදවතින් එක්වී දුකට ඇහුම්කන් දී දුක බෙදා ගතයුතුය.

## ආදර්ශමත් වීම

යම් ආගමක් හෝ ශ්‍ර ද්ධාව පිළිබඳ වැරදි අවබෝධයන් ඇති වන්නේ, ඒ පිලිබදව අපි කටයුතු කරන ආකාරය අනුවයි. අප සංවිධානයේ නිර්මාතෘතුමා නිතරම පැවසු දෙයක් නම් ‘අනුශාසනා කරනවාට වඩා, ආදර්ශමත්ව කටයුතු කිරීම අමතක නොකල යුතුය’ යන්නයි. එබැවින් අප නිතරම ආදර්ශයන් තුලින් ධර්මය දේශනා කිරීම වැදගත්ය.

උදාහරණයක් ලෙස, අප සිටිනා ප්‍රදේශය පිරිසිදු කිරීමේ කටයුතු වල නිරත වන විට, ආගම දහම හෝ ශ්‍රද්ධාව පිලිබද පැහැදීමක් නැති පුද්ගලයන් පවා එය අගය කරයි. එය සමාජයට කරන්නාවු යහපත් සත්කාරයක් නිසාය. එසේ නොමැතිව අපේ ආගම තමයි හොදම, අපේ ශාස්තෘවරයානන් පමණයි ශ්‍රේෂ්ඨ යන හැගීමෙන් කටයුතු කල විට ආගම දහම නොරුස්සන පිරිස තව වැඩි විය හැකිය.

ලෝක සාමය ළඟා කර ලීමේ අභිප්‍රායෙන් කටයුතු කරනවා නම් ජාතීන් හෝ ආගම් වශයෙන් වෙන්වී කටයුතු නොකර එකමුතුව ඉදිරියට යාමට අන්‍යයන් ගැන සිතන, පරාර්ථකාමී ආදර්ශයෙන් කටයුතු කරන හදවතක් ඇතිකර ගැනීම වැදගත්ය.

සද්ධර්ම පුණ්ඩරීක සුත්‍ර යේ තථාගතයන් වහන්සේගේ සදතන ජිවිතය පිලිබද පරිච්ඡේදයේ මෙසේ සදහන් වේ.

‘කෙසේ නම් සියළු සත්වයින් ශ්‍රේෂ්ඨ වු මාර්ගයට පිවිසවන්නේද කියා, ඔවුන්ගේ බුදුබව ක්ෂණිකව පිරිපුන් කරන්නේද යන සිතුවිල්ලෙන් සියළු ධර්මයම විවරණය කරන්නෙමි’ මෙලෙස විශාල පිරිසක් ධර්ම මාර්ගයට ගන්නේ කෙසේද, ධර්මාවබෝධය ලගා කර ගැනීම තුලින් සතුටට පත්වන්නේ කෙසේද, යන්න බුදුන් වහන්සේ නිතරම ආශිර්වාදය සලසයි. එලෙස බුදුන් වහන්සේගේ ප්‍රාර්ථනය අපගේ ප්‍රාර්ථනය ලෙස අධිෂ්ඨාන කරගෙන අන්‍යයන් ගැන සිතා, අවංකව , නිහතමානිව එදිනෙද ජිවිතයක් ගත කිරීම ඉතා වැදගත් වේ. ඒ අනුව කටයුතු කිරීමේදි අවට සිටින අය එම මාර්ගය පිලිගෙන කටයුතු කරයි නම්, එය ශ්‍ර ද්ධාව තුලින් අප ලබා ගන්නා ආනිශංස වේ.

මේ ඔක්තොම්බර් මාසය යනු අපගේ නිර්මාතෘතුමා වන නික්යෝ නිවානෝ තුමාගේ 17 වන ගුණානුස්මරනය සමරන මාසයයි. එබැවින් එතුමන් බලාපොරොත්තු වන ආකාරයට කටයුතු කිරීමට අප නිතරම උත්සහ කරමු.

From *Kosei*, October 2015.



# පවුලේ සැමට කෘතවේදීත්වය පිරිනැමීමට කියාදුන් දහම

ධම්මි රණසිංහ
රිෂ්ෂෝ කෝසෙයි ධම්ම පදනම

*මෙම ජීවන අත්දැකීම 2015 මාර්තු මස 05 වන දින පැවති පොහොය දින වැඩසටහනේදී ඉදිරිපත් කෙරුණි.*

මම ධම්මි රණසිංහ වෙමි. අයියලා තිදෙනෙකුත් අක්ක කෙනෙකු හා නංගි කෙනෙකුගෙන් යුතු පවුලේ 5 වැනියා ලෙස 1961 ජනවාරි මස 05 වන දින පොලොන්නරුවේදී මා උපත ලැබීය.

මගේ පියා ග්‍රාම නිලධාරියෙකු වූ අතර විවේක අවස්ථාවන් වල ගොවිතැන් කරමින් ඉතා උනන්දුවෙන් පවුල රක්ෂා කළහ. පවුලේ සියලුදෙනා ඉතා සාමකාමීව සිටියහ. කිසි කෙනෙකුට ණයක් නොවී සිටි මගේ පියාට එය මහත් අභිමානයක් විය. දෙමව්පියන්ගේ දැඩි ආදරය මධ්‍යයේ මා හැදී වැඩුණි.

එකල අපේ නිවසේ එක් කාමරයක් කුලියට දී තිබූ අතර රැකියවක් කරන තරුණයෙක් එහි පදිංචි වී සිටියහ. තාත්තා අසනීප වූ විටදී පවා එම තරුණයා ඉතා කරුණාවෙන් තාත්තගේ සෑම වැඩ කටයුත්තක්ම සොයා බලා සිදුකලහ. ඉතා කාරුණික ඔහු කෙරෙහි ආදර හැඟුම් පහලව දෙමවුපියන්ගේ ආශිර්වාදය මැද අප දෙදෙනා 1980 සැප්තැම්බර් මස 05 වනදා විවාහ දිවියට එළඹුණා. එම තරුණයා වෙන කවුරුත් නොව අදටත් මා සමගින් ජීවිතය එකට බෙදාගනිමින් කටයුතු කරන ආදර සැමියා වන ධර්මසේන සෙනෙවිරත්නයි. මාගේ සැමියගේ ගම අනුරාධපුරයයි. මාගේ සැමියා විශේෂයෙන් තාත්තාගේ දැඩි ආදරයට ලක් වූ නිසා මගේ විවාහයේදී මහ ගෙදර සහ කුඹුරක් දැවැදි ලෙස තාත්තා මට ත්‍යාග දුන්න. එයින් මාස 3 කට පසු තාත්තා මෙලොව හැරද අපෙන් සදහටම සමුගත්හ.

ඉන්පසු ටික කලෙකින් මාගෙ සැමියා මඩකපුව ප්‍රදේශයේ කජු සංස්ථාවේ රැකියවකට මාරු විය. නමුත් යුද්ධය පැවති නිසා නියම ආකාරයෙන් රැකියවේ නියලීමට නොහැකිව නැවතත් පොලොන්නරුවට පැමින දේශපලඥයෙකුගේ පෞද්ගලික ලේකම් වශයෙන් කටයුතු වල නිරත විය. ඒ විදියට ජීවිතය ඉතා සතුටෙන් අප දෙදෙනා ගතකල අතර 1982 දී මගෙ පුතා චමිල් සසංක සෙනෙවිරත්න" 1984 දී දුව ශිරෝමා නිල්මිණි ද මෙලොවට බිහිවිය. සැමියාගේ ආදයම් තත්වය ඉතා හොඳින් තිබුණු අතර කිසිම ආර්ථික ප්‍රශ්ණයක් අපට නොවිය. ඒ කාලයේ පොලොන්නරුව කදුරුවෙල දෙමහල් නිවසක් ඉදිකිරීමට හැකි විය. ඊට අමතරව තව කුඩා ගෙයකුත් අපසතු විය. සැමියට අයත් අනුරාධපුරයේ නිවස අළුත්වැඩියා කර අලංකාර කළහ. ඒ අනුව විවාහ වී අවුරුදු 12 ක් යන විට තාත්තාගෙන් ත්‍යාග ලැබුණු නිවස, නව නගරයේ සෑදූ අළුත් නිවස, කුඩා ගෙය හා අනුරාධපුරයේ නිවස ඇතුලුව නිවෙස් 4 ක හිමිකාරිනියක් විමට මට හැකි විය.

දරුවන් ටිකෙන් ටික ලොකු මහත් වන විට ඔවුන්ට හොඳින් අධ්‍යාපනය දිය යුතුයි කියා සැමියත් මමත් කොළඹට පැමිණීමට අදහස් කලහ. නමුත් පවුලේ සියලුදෙනාම එයට විරුද්ධ විය. එම විරුද්ධත්වය නොසලකා අපි පොලොන්නරුව අත්හැර කොළඹට පැමිණියෙමු. එලෙස පැමිණෙන විට මා සතු වූ පොලොන්නරුව කදුරුවෙල දෙමහල් නිවස විකුණූ අතර, කුඩා ගෙය නිවසේ සේවය කළ මෙහෙකාරියටත්, දැවැද්දට තාත්තා දුන් නිවස අයියාටත් පරිත්‍යාග කළාය.

කුඹුර පන්සලට පුජා කළාය. අනුරාධපුර නිවස නැන්දම්මාට ලබා දුන්හ.



*පොහොය වැඩසටහනේදී ජීවන අත්දැකීම ඉදිරිපත් කරන ධම්මි මිය.*

කොළඹදී සැමියාට ඉතා ඉහල ආදායමක් සමග භාණ්ඩ ප්‍රවාහන ආයතනයක රැකියාවක් ලැබුණි. අපි කඩවත ප්‍රදේශයේ නව නිවසක්ද සාද බලාපොරොත්තු පොදියක් සමග නව ජිවිතය අරඹා ඉතා සතුටින් කාලය ගත කළහ.

මේ අතර සැමියාට ජපානයට යාමට අවස්ථාවක් උදාවිය. ජපානයේදී වැඩ කරන්නට ලැබුණොත් තවත් හොඳින් මුදල් උපයා ගැනීමට හැකියයි අපට නව බලාපොරොත්තුවක් එක් කළහ. ඉතා අධික පොලියකට ලබා ගත් ණය මුදල වැය කර 1996 දී සැමියා ජපානය බලා පිටත් විය.

නමුත් ජපානයේ රැකියාව කිරීමට ලැබුණේ මාස 02 ක පමණයි. ඉන්පසු සැමියාගේ එදිනෙදා වියදමටත් ණය වෙමින් ලංකාවෙන් මුදල් යැවීමට සිදුවිය. නියම ආදායමක් නොමැති නිසා ණය ගෙවා ගත නොහැකි වූ විට, නැවත ණයවෙමින් තිබූ ණය පියවීමට කටයුතු කළහ.

ණය බර අධික වීමත් සමගම කොළඹදී අප සෑදූ නිවස සින්නවිය. මා ඇඳුම් මැසීමෙන් ලද ආදායම හා කුඩා රැකියාවල් කරමින් සැමියා උපයාගත් මුදල සිගරට් හෝ මත්පැන් වලට වියදම නොකර ලංකාවට එවූ නිසා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩපණ නොකර දිගටම කිරීමට හැකිවිය.

ටික කලකින් සැමියා ලංකාට පැමිණියත් ඔහු සැහෙන්න මානසිකව වැටී සිටියහ. දිනෙන් දින ණය බර වැඩිවන විට 'පොලොන්නරුවේ ඉතා හොඳින් ජිවත් වූ අපට ඇයි මේ වගේ තත්වයක් උදේ වුනේ....' යැයි නිතරම මැසිවිලි නැගුණි.



ධම්මි රණසිංහ මිය.

මේ අයුරින් ඉතා දුක් බර ජිවිතයක් ගත කළ මා හට 2006 වර්ෂයේදී නංගී විසින් 'ආගමට දහමට ලැදි අක්කාට හොඳම තැනක් තියෙනවා, ගිහින් බලන්න' යැයි කියමින් රිෂ්ෂෝ කෝසෙයි කායි හඳුන්වා දුන්හ. මුලින්ම කෝසෙයි කායි එකට පැමිණි දවස අදටත් මට හොඳට මතකයි.

ධර්ම මන්දිරයට ඇතුළු වෙනකොට සුභ උදෑසනක් වේවා කියා මාව ආදරෙන් පිළිගත්තා. සාමන්‍යයෙන් දෑත් එක් කර පිළිගැනීම් නොලබන නිසා පුදුම සතුටක් සිතට දැනුනි. කෝසෙයි සංවිධානයේදී ප්‍රථම වතාවට බුදුදහම අප එදිනෙදා ජිවිතයට ප්‍රායෝගිකව බද්ධ කර ගන්නා අයුරු ඉගෙන ගැනීමට හැකි විය.

කෝසෙයි කායි එකට පැමිණෙන විට ජිවිතයට ලොකු සැහැල්ලුවක් දැනුනි. ඒ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මාගේ ජිවිතයට රුකුලක් වූ නිසායි. ණය බර එසේමයි, නමුත් හිතට පුදුම සැනසීමක් ....... මෙලෙස සැනසීමෙන් කටයුතු කරන මා දුටු සැමියා හා දරුවන් 2 නා කෝසෙයි කායි එකට නිතරම පැමිණීමට සහයෝගය ලබා දුන්හ.

මේ කාලයේ යමමොතෝ ක්යෝකයිචෝ සාන් ශ්‍රී ලංකාවට ශාඛා ප්‍රධානී ලෙස පැමිණියහ. මාගේ ප්‍රශ්න සෑමදෙයක්ම එතුමා සමග කථාකිරීමට හැකියාව ලැබුණි. මට හොඳින් ඇහුම්කන් දුන් එතුමා අවසානයට පැවසුවේ, 'මහ ගෙදරත්, කුඹුරත් ඔයාගේ නමට ලියන්න තරම් දෙමාපියන් ඔයා ගැන ගොඩක් හිතුවා නේද.... ඒ නිසා දෙමාපියන්ට හදවතින්ම කෘතවේදී වුනොත් හොඳයි කියාය'. ඇත්තටම දෙමව්පියන් සිටින කාලයේ ඔවුන්ව හොඳින් රැකබලා ගෙන කටයුතු කලාට කවදාවත් හදවතින්ම කෘතවේදී විය යුතුයි කියා හැඟීමක් නොතිබුණු බව තේරුම් ගියා. එද සිට හැමදම බුදුන් වැද දෙමව්පියන්ට හදවතින්ම කෘතවේදී වීම මම කරගෙන එනවා.

ණය ප්‍රශ්න වැඩි වෙනකොට දෙමව්පියන්ව පමණ-ක් නොවේ, බුදුන් වහන්සේවත් අමතක වී තිබුණා.නමුදු ක්යෝකයිචෝ සාන් විසින් 'කුමන ප්‍රශ්නයක් ආවත්, බුදුන් වහන්සේව අමතක නොකර නිතරම බුදුන් වහන්සේ තමාව ආරක්ෂා කරනවා කියන හැඟීමෙන් කටයුතු කරන්න, ඒ වගේම දෙමව්පියන්ට කෘතවේදී වෙමින් බුද්ධ මාර්ගයේ ගමන් කර ධර්මයේ හැසිරෙන විට ටිකෙන් ටික ප්‍රශ්න නිරාකරනය වන බවට මට කියා දුන්හ'.

ඒ අයුරින් දිනපතා සූත්‍ර සජ්ඣායනය කර බුදුන් වහන්සේ සමග කථා කරන විට හදවතට ලොකු සැනසීමක් දැනෙන්නට විය. නමුත් ඉතාමත් යහපත් ගති ඇති මහත්තයා සමග ළඟදී ඉදලා නිතරම කෙන්තියන ගතිය වැඩි වී ඇත. සැමියාගේ බුද්ධ ශක්තිය නිතරම හැල්ලු කර කටයුතු කිරීම හොඳ නැති බැවින් මින් ඉදිරියට බුදුන් වහන්සේගේ බුද්ධ ශක්තිය වඩා හොඳින් විශ්වාස කර කෘතවේදී වීමට උත්සහ ගනිමි.

මේ අයුරින් සියළු දෙනාගේම බුද්ධ ශක්තියට ගෞරවකිරීම පුහුණු කරන විට ණය බරින් 100%ක් නිදහස් වී නොමැතු වුවද සියළු ණය ප්‍රමාණයම ගෙවා නිමකිරීමට හැකි ආත්ම ශක්තියක් ඇති විය. ඒ සෑම දෙයටම වඩා ඕනෑම දෙයකදී අප දෙදෙනාට නිතරම උදව් කරන දරුවන් දෙදෙනෙකු සිටීමේ සතුට දැනුනි.

ඉස්සර නිවාස 4 ක හිමිකාරියක් වි සිටියානේ යන්න නිතරම මැසිවිලි නගමින් දුකින් සිටියත් දැන් කුලී නිවසක සිටියද පවුලේ සියළු දෙනාම එකට සිටීමේ සතුට බෙදා හදා ගන්නට හැකි වී තිබෙනවා. ණය බරින් පිඩාවට පත් වීමේ පිහිටෙන් මේවාගේ විශිෂ්ට අඹුසැමියන් බවට පත් වන්නටත් යහපත් දරුවන් දෙදෙනෙකු හදවඩා ගන්නටත් හැකිවූයේ නේද යන්න නිතරම හැගෙයි.

ඉස්සර නම් නිතරම මං වගේ මුදල් ප්‍රශ්න තිබෙන කවුරුත්ම නැතුව ඇති, මේක නම් මගේ පෙර කරුමයක් යැයි සිතුනි. කා සමගවත් කථා කළේවත් නැත. සියදිවි හානි කරගන්නට සිතුන වාරත් අනන්තයි. නමුත් දැන්නම් බුදුන් වහන්සේ අපිට මෙච්චර ප්‍රශ්න දුන්නේ සාමයෙන් සතුටින් පිරි පවුලක් බවට පත් කරන්නට නේ දැයි කියා දැන් සිතේ.

මගේ අත්දැකීම් හා රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ කියා දීම් අසල් වාසින් හා නෑදෑයන්ටත් කියා දීමට උත්සහ කරමින් කටයුතු කරමි. මේ වසරේ සිට අප ශාඛාවේ පවුල් හෝසා කණ්ඩායම් ව්‍යාප්ත කිරීම ඇරඹිණි. දුප්පත් පොහොසත් බේදයක් නොමැතිව තම අසල්වාසින් නෑදෑයන් එකතු කර හෝසා කිරීමට කැමති ඕනෑම කෙනෙකුට තමා විසින් ප්‍රතිඥාවක් දී හෝසා කණ්ඩායම් නායකයෙකු වීමට හැකිය. මමද හෝසා කණ්ඩායම් නායකයෙකු ලෙස විශාල සාමාජික පිරිසක් දුකින් මුදවා ලීමට උත්සහයෙන් කටයුතු කරමි. ඒ සෑම හෝසා වටයකටම ක්යෝකයිචෝ සානුත් ශිබුචෝ සානුත් පැමිණ ධර්මය ප්‍රායෝගික පැත්ත නිතරම කියාදේ. ඒ තුලින් කෝසෙයි කායි කියාදීම් වලට ඇල්ම දක්වන පිරිස ටිකෙන් ටික වැඩි විය. අදත් මා විසින් හදුන්වාදුන් එක් සාමාජිකාවකගේ නිවසේ බුද්ධ රූපය තැන්පත් කිරීම සිදු කලහ. ඔවුන් අතර එක් එක් ආකාරයේ ප්‍ර ශ්න තිබෙන අය සිටියි. විවිධාකාරයේ ප්‍රශ්න තිබෙන පුද්ගලයන් තුලින් තමා පිළිබඳ පසු විපරම් කිරීමට අවස්ථාව උදව් තිබෙන බව ක්යෝකයිචෝ සාන් නිතරම මතක් කර දෙයි.

මට දැන් එක් මුණුපුරෙක් සිටියි. ඒ කාර්යබහුලත්වය නිසා නිතරම ඩෝජෝවට නිතරම පැමිණිමට නොහැකි වී ඇත. නමුදු සැමියා නිතරම ඩෝජෝවට යාමට මා දිරිමත් කරයි. ඒ කෝසෙයි කායි එකට පැමිණ ආපසු නිවසට එන මාගේ ලොකු වෙනසක් ඔහු අත්දකින නිසා වන්නට ඇතැයි සිතමි.

දැන් මාගේ දුව NDB බැංකුවේ හා පුතා ජනශක්ති රක්ෂණ ආයතනයේ කළමණාකරුවන් ලෙස රැකියාව කරනවා. ඔවුන් ඉතා කැපවීමන් රැකියාව කරන අතර අපට ගොඩක් ආදරය කරන, උදව් කරන ඉතා විශිෂ්ට දරුවන් දෙදෙනෙක් බවට පත් වී සිටිනවා. නමුත් ඉදහිට 'අපි දුක් විදලා උගන්වපු නිසානේ ඔවුන් අද මේ තත්වයේ සිටින්නට හැකියාව ලැබුණේ' කියා සිතන වෙලාවල් තිබෙන නිසා බුද්ධ ශක්තියෙන් අගතැන්පත් දරුවන් දෙදෙනෙකු වූවත් මාගේ හදවතින්ම කෘතවේදී වීමට තවම මට නොහැකි වී තිබෙනවා.

මින් ඉදිරියට කෝසෙයි කායි හි කියාදීම් තව තවත් ඉගෙන ගෙන දරුවන්ගේ බුද්ධ ශක්තියට හදවතින්ම ගෞරව කර කෘතවේදී වීමටත් විශාල පිරිසක් ධර්මය තුලින් දුකින් මුදවාලීමටත් මාගේ බුද්ධ ශක්තිය වඩ වඩා විශ්වාස කර බුදුන් වහන්සේට සමීප වෙමින් කෘතවේදී හදවතින් සිටීමට හැකි කෙනෙකු බවට පත්වීමට උපරිම උත්සහ ගනිමි.



*මැහුම් කටයුතු වල නිරත වන ධම්මි මිය.*

Living the Lotus welcomes your religious experience. Why don't you share your religious experience through *Living the Lotus* with members all over the world? Please send your script or inquiry to our email address: living.the.lotus.rk-international@kosei-kai.or.jp. Thank you.

# Living the LOTUS

We welcome comments on our e-newsletter Living the Lotus.
Please send us your comments to the following e-mail address.
E-mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp

Column

## මෛත්‍රිය හා කරුණාව පිරී හැගීමෙන් ජීවිතය ගත කිරීම

මේ මස නිව්කෝ නිවානෝ තුමාගේ මාසික ධර්ම පණිවිඩය තුල 'ශ්‍රද්ධාව යනු මෛත්‍රිය හා කරුණාවේ සිතුවිලි ඇති කරගෙන අන් අය ගැන සිතන පු ද්ගලයකු ලෙස ජිවත් විමය' ලෙස ඉගෙන ගතිමි. බුදු දහමේ දශ ලෝකයන් (නිරය, ප්‍රේත, අසුර, තිරිසන්, මනුෂ්‍ය, දේව, ශ්‍රාවක, අරහත්, බෝධිසත්ව, බුද්ධ) ගැන කථා කිරීමේදී, හැම කෙනෙකුගේ හදවතකම ක්‍රෝධය හා තෘෂ්ණාව සමගම මෛත්‍රිය හා කරුණාවද තිබේ. ඕනෑම කෙනෙකු මෛත්‍රිය හා කරුණාවේ බුද්ධ ස්වභාවයට අනුව කටයුතු කිරීමේදි වචන පවා කාරුණික හා උණුසුම් වදන් වේ. කේන්තියෙන් හා තෘෂ්ණාවෙන් කටයුතු නොකර මෛත්‍රිය හා කරුණාවේ බුද්ධ ස්වභාවයෙන් කටයුතු කිරීම ශ්‍රද්ධාව වේ.

මීට අවුරුදු 20 පෙර තෙරේසා මව් තුමියට එක්වරු දනමය පදනමේ පරිත්‍යාග ප්‍රධානයට ගිය අවස්ථාවක් මෙහිදි සිහියට නැගුණි. තෙරේසා මව් තුමිය ඉතා කාරුණික හා උණුසුම පිරුනු මුහුණින් 'ඔබලාගේ එක්වරු දනමය ක්‍රියාවලිය හරියට අපගේ දෙවියන් වහන්සේගේ ආදරය පතුරවාලීමේ ක්‍රියාව හා සමානය.' ලෙස පැවසිය. ඉතා කුඩා ශරිරයකින් හෙබි තෙරෙසා මව් තුමිය ඉතා දුෂ්කර පරිසරයක් තිබෙන ඉන්දියාව තුල දෙවියන් වහන්සේගේ ආදරය සැමට පතුරවාලිය. ඇය දෙවියන් වහන්සේගේ ස්වභාවය තම හදවතට බද්ධ කරගෙන සිටියහ.

දෙවියන් හෝ බුදුන්ගේ වහන්සේගේ හදවත බදු මෛත්‍රිය හා කරුණාවන්ත හැගීමකින් ජිවත් වන විට, නිතරම අන්‍යන් ගැන සිතන පුද්ගලයන් බවට පත් විමට හැකිවේ. එවිට තෙරේසා තෙරේසා මව් තුමිය ලෙස හෝ අප සංවිධානයේ නිර්මාතෘ නික්යෝ නිවානෝ තුමා ලෙසින් විශිෂ්ට වු ජිවිත ගත කිරිමට අපටද හැකි වේ.

රි.කෝ.කා. අන්තර්ජාතික මුලස්ථාන ප්‍රධානී
ශෝකෝ මුසුතනි මහතා

## රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය පිලිබඳව



# Rissho Kosei-kai
# Overseas Dharma Centers 2015

## Rissho Kosei-kai International
5F Fumon Hall, 2-6-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224

### Rissho Kosei-kai International of North America (RKINA)
2707 East First Street Suite #1 Los Angeles
CA 90033 U.S.A
*Tel:* 1-323-262-4430 *Fax:* 1-323-262-4437
*e-mail:* info@rkina.org http://www.rkina.org

### Branch under RKINA
**Rissho Kosei-kai of Tampa Bay**
2470 Nursery Rd.Clearwater, FL 33764, USA
*Tel*: (727) 560-2927
*e-mail*: rktampabay@yahoo.com
http://www.buddhismtampabay.org/

### Rissho Kosei-kai International of South Asia (RKISA)
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel*: 66-2-716-8141 *Fax*: 66-2-716-8218
*e-mail*: thairissho@csloxinfo.com

### Rissho Kosei-kai Buddhist Church of Hawaii
2280 Auhuhu Street, Pearl City, HI 96782, U.S.A.
*Tel:* 1-808-455-3212 *Fax:* 1-808-455-4633
*e-mail:* info@rkhawaii.org http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, U.S.A.
*Tel:* 1-808-242-6175 *Fax:* 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, U.S.A.
*Tel:* 1-808-325-0015 *Fax:* 1-808-333-5537

### Rissho Kosei-kai Buddhist Center of Los Angeles
2707 East First Street, Los Angeles, CA 90033, U.S.A.
*Tel:* 1-323-269-4741 *Fax:* 1-323-269-4567
*e-mail:* rk-la@sbcglobal.net http://www.rkina.org/losangeles.html

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
6083 Babcock Road, San Antonio, TX 78240, U.S.A.
*Tel:* 1-210-561-7991 *Fax:* 1-210-696-7745
*e-mail:* dharmasanantonio@gmail.com
http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai Buddhist Center of Arizona**

**Rissho Kosei-kai Buddhist Center of Colorado**

**Rissho Kosei-kai Buddhist Center of San Diego**

**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**

**Rissho Kosei-kai Buddhist Center of Dallas**

### Rissho Kosei-kai of San Francisco
1031 Valencia Way, Pacifica, CA 94044, U.S.A.
*Tel:* 1-650-359-6951 *Fax:* 1-650-359-6437
*e-mail:* info@rksf.org http://www.rksf.org

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, U.S.A.
*Tel:* 1-253-945-0024 *Fax:* 1-253-945-0261
e-mail: rkseattle@juno.com
http:// www.buddhistLearningCenter.com

**Rissho Kosei-kai of Sacramento**

**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of Vancouver**

### Rissho Kosei-kai of New York
320 East 39th Street, New York, NY 10016, U.S.A.
*Tel:* 1-212-867-5677 *Fax:* 1-212-697-6499
*e-mail:* rkny39@gmail.com http://rk-ny.org/

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, U.S.A.
*Tel :* 1-773-842-5654
*e-mail:* murakami4838@aol.com
http://home.earthlink.net/˜rkchi/

**Rissho Kosei-kai Dharma Center of Fort Myers**

### Rissho Kosei-kai Dharma Center of Oklahoma
2745 N.W. 40th Street, Oklahoma City, OK 73112, U.S.A.
*Tel & Fax:* 1-405-943-5030
*e-mail:* rkokdc@gmail.com http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Buddhist Center of Klamath Falls**
1660 Portland St. Klamath Falls, OR 97601, U.S.A.
**Rissho Kosei-kai, Dharma Center of Denver**
1571 Race Street, Denver, Colorado 80206, U.S.A.
*Tel:* 1-303-810-3638
**Rissho Kosei-kai Dharma Center of Dayton**
635 Kling Dr, Dayton, OH 45419, U.S.A.
http://www.rkina-dayton.com/

### Risho Kossei-kai do Brasil
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP,
CEP 04116-060, Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377
*Fax:* 55-11-5549-4304
*e-mail:* risho@terra.com.br http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP,
CEP 08730-000, Brasil
*Tel:* 55-11-5549-4446/55-11-5573-8377

### Rissho Kosei-kai of Taipei
4F, No. 10 Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
*Tel:* 886-2-2381-1632 *Fax:* 886-2-2331-3433
http://kosei-kai.blogspot.com/

**Rissho Kosei-kai of Taichung**
No. 19, Lane 260, Dongying 15th St., East Dist.,
Taichung City 401, Taiwan
*Tel:* 886-4-2215-4832/886-4-2215-4937 *Fax:* 886-4-2215-0647

### Rissho Kosei-kai of Tainan
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
*Tel:* 886-6-289-1478 *Fax:* 886-6-289-1488

**Rissho Kosei-kai of Pingtung**

### Korean Rissho Kosei-kai
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
*Tel:* 82-2-796-5571 *Fax:* 82-2-796-1696
*e-mail:* krkk1125@hotmail.com

**Korean Rissho Kosei-kai of Pusan**
1258-13, Dae-Hyun-2-dong, Nam-ku, Kwang-yok-shi, Pusan, 608816,
Republic of Korea
*Tel:* 82-51-643-5571 *Fax:* 82-51-643-5572

### Branches under the Headquarters
**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road,
North Point, Hong Kong,
Special Administrative Region of the People's Republic of China
*Tel & Fax:* 852-2-369-1836

**Rissho Kosei-kai of Ulaanbaatar**
15f Express tower, Enkh taiwnii urgun chuluu, 1st khoroo, Chingeltei district, Ulaanbaatar, Mongolia
*Tel:* 976-70006960
*e-mail:* rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Sakhalin**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk
693005, Russian Federation
*Tel & Fax:* 7-4242-77-05-14

**Rissho Kosei-kai of Roma**
Via Torino, 29-00184 Roma, Italia
*Tel & Fax :* 39-06-48913949
*e-mail:* roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**

**Rissho Kosei-kai of Venezia**
Castello-2229 30122-Venezia Ve Italy

**Rissho Kosei-kai of Paris**
86 AV Jean Jaures 93500 Tentin Paris, France

**Rissho Kosei-kai of Sydney**

## International Buddhist Congregation (IBC)
5F Fumon Hall, 2-6-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1230 *Fax:* 81-3-5341-1224
*e-mail:* ibcrk@kosei-kai.or.jp http://www.ibc-rk.org/

# Rissho Kosei-kai of South Asia Division
5F Fumon Hall, 2-6-1 Wada, Suginami, Tokyo, 166-8537, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224

## Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218
*e-mail:* info.thairissho@gmail.com

## Rissho Kosei-kai of Bangladesh
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
*Tel & Fax:* 880-31-626575

**Rissho Kosei-kai of Dhaka**
House No.467, Road No-8 (East), D.O.H.S Baridhara,
Dhaka Cant.-1206, Bangladesh
*Tel:* 880-2-8413855

**Rissho Kosei-kai of Mayani**
Maitree Sangha, Mayani Bazar, Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Patiya**
Patiya, sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Domdama**
Domdama, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Cox's Bazar**
Ume Burmese Market, Main Road Teck Para, Cox'sbazar, Bangladesh

**Rissho Kosei-kai of Satbaria**
Satbaria, Hajirpara, Chandanish, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Laksham**
Dupchar (West Para), Bhora Jatgat pur, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai of Raozan**
West Raozan, Ramjan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Chendirpuni**
Chendirpuni, Adhunagor, Lohagara, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Ramu**

## Rissho Kosei-kai Dhamma Foundation, Sri Lanka
382/17, N.A.S. Silva Mawatha, Pepiliyana, Boralesgamuwa, Sri Lanka
*Tel & Fax:* 94-11-2826367

**Rissho Kosei-kai of Polonnaruwa**

**Rissho Kosei-kai of Habarana**
151, Damulla Road, Habarana, Sri Lanka

## Branches under the South Asia Division

**Rissho Kosei-kai of Central Delhi**
224 Site No.1, Shankar Road, New Rajinder Nagar, New Delhi, 110060, India

**Rissho Kosei-kai of West Delhi**
66D, Sector-6, DDA-Flats, Dwarka
New Delhi 110075, India

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar,
Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsilhel, Sancepa-1, Lalitpur,
Kathmandu, Nepal
*Tel:* 977-1-552-9464 *Fax:* 977-1-553-9832
*e-mail:* nrkk@wlink.com.np

**Rissho Kosei-kai of Singapore**

**Rissho Kosei-kai of Phnom Penh**
#201E2, St 128, Sangkat Mittapheap, Khan 7 Makara,
Phnom Penh, Cambodia

## Other Groups

**Rissho Kosei-kai Friends in Shanghai**